ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

පෙර පාසල් අධ්‍යාපනය පිළිබඳ සහතික පත්‍ර වැඩ සටහන

පළමු සමාසික අවසාන පරීක්ෂණය 2006/2007

**ESC 1121/1132 -** පෙර පාසල් අධ්‍යාපන මූලධර්ම

කාලය පැය දෙකයි.

---

දිනය - 2006.10.21 වේලාව - පෙ.ව.10.00 - මධ්‍යාහ්න 12.00 දක්වා

---

ඕනෑම ප්‍රශ්න හතරකට (04) පමණක් පිළිතුරු සපයන්න.

01. (i) පෙර පාසල් අධ්‍යාපනය යන්නෙන් ඔබ අදහස් කරන්නේ කුමක්දැයි සැකෙවින් පැහැදිලි කරන්න.
(ලකුණු 08)

(ii) පෙර පාසල් අධ්‍යාපනයේ අරමුණු හතරක් (04) සඳහන් කරන්න.
(ලකුණු 04)

(iii) ඉහත සඳහන් කළ අරමුණු අතරින් දෙකක් තෝරාගෙන එම අරමුණු ඉටුකර ගැනීම සඳහා පෙර පාසලක් තුළ ක්‍රියාත්මක කළ හැකි ක්‍රියාකාරකම් දෙකක් (02) විස්තර කරන්න.
(ලකුණු 13)

02. (i) "ළමා කේන්ද්‍රීය අධ්‍යාපනය" සංකල්පය කෙටියෙන් පැහැදිලි කරන්න.
(ලකුණු 08)

(ii) මෙම සංකල්පය සංවර්ධනය කිරීම සඳහා දායක වූ අධ්‍යාපන දාර්ශනිකයින් දෙදෙනෙකු (02) නම් කරන්න.
(ලකුණු 02)

(iii) පෙර පාසල් වයසේ ළමුන්ට අධ්‍යාපනය සැපයීම පිළිබඳව ඔබ නම් කළ දාර්ශනිකයින් දක්වා ඇති අදහස් සඳහන් කරන්න.
(ලකුණු 15)

03. පහත සඳහන් රටවල් අතුරින් දෙකක් තෝරාගෙන එම රටවල මුල් ළමාවිය අධ්‍යාපනය සැපයෙන ආකාරය පිළිබඳව විස්තර කරන්න.

(i) ජපානය

(ii) චීනය

(iii) රුසියාව

(iv) එක්සත් රාජධානිය

(ලකුණු 25)

**04.** **(i)** හොඳ පෙර පාසල් ගුරුවරියක් සතුවිය යුතු ගුණාංග පහක් (05) සඳහන් කරන්න.

(ලකුණු 05)

**(ii)** මෙම ගුණාංග හොඳ පෙර පාසල් ගුරුවරියක් සතුවිය යුතු යයි ඔබ සලකන්නේ ඇයිදැයි පැහැදිලි කරන්න.

(ලකුණු 10)

**(iii)** ඉහත ගුණාංග පෙර පාසල් ගුරුවරිය තුළ වර්ධනය කර ගැනීම සඳහා පෙර පාසල් ගුරු අධ්‍යාපන වැඩ සටහනක් හැදෑරීමේ ඇති වැදගත්කම පෙන්වා දෙන්න.

(ලකුණු 10)

05. **(i)** පෙර ළමාවිය ළමුන්ගේ රැකවරණය සහ අධ්‍යාපනය සඳහා ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන පද්ධති /ආයතන වර්ග දෙකක් (02) නම් කරන්න.

(ලකුණු 05)

**(ii)** ශ්‍රී ලංකාව තුළ එම වර්ග දෙක (02) ක්‍රියාත්මක වන අයුරු වෙන වෙනම විස්තර කරන්න.

(ලකුණු 20)

06. **(i)** ශ්‍රී ලංකාවේ පෙර පාසල් අධ්‍යාපනයේ ඓතිහාසික පසුබිම කෙටියෙන් විස්තර කරන්න.

(ලකුණු 10)

**(ii)** ශ්‍රී ලංකාවේ පෙර පාසල් අධ්‍යාපනයේ දියුණුව හා සංවර්ධනය කෙරෙහි රාජ්‍ය හා රාජ්‍ය නොවන සංවිධානවල කාර්යභාරය විවේචනාත්මකව විභාග කරන්න.

(ලකුණු 15)

\- හිමිකම් ඇවිරිණි. -